# කාර්යසාධන වාර්තාව

# 2025

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

அரச தொழில்முயற்சிகள் திணைக்களம்
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

**Department of Public Enterprises**
**Ministry of Finance, Planning & Economic Development**

මහා භාණ්ඩාගාරය
කොළඹ 01

பொது திறைசேரி
கொழும்பு 01

**General Treasury**
**Colombo 01**

# කාර්යසාධන වාර්තාව - 2025

*වැය ශීර්ෂය - **241***

## රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

### මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# අන්තර්ගතය


| | | |
|---|---|---|
| **පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය** | | **1- 4** |
| 1.1 | හැඳින්වීම | 1 |
| 1.2 | ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | 1 |
| 1.3 | ප්‍රධාන කාර්යයන් | 2 |
| 1.4 | සංවිධාන සටහන | 3 |
| 1.5 | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ | 4 |
| 1.6 | දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් | 4 |
| 1.7 | විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) | 4 |
| **පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | | **5** |
| **පරිච්ඡේදය 03 – 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය** | | **6- 19** |
| 3.1 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 6 |
| 3.2 | මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය | 7 |
| 3.3 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 8 |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 9 |
| 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 10 |
| 3.6 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | 10 |
| 3.7 | මු.රෙ.208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 10 |
| 3.8 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 11 |
| 3.9 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 12 - 19 |
| **පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක** | | **20 - 27** |
| 4.1 | ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 20 -27 |
| **පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය** | | **28 - 30** |
| 5.1 | හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු | 28 - 29 |
| 5.2 | තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 30 |
| **පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ** | | **31 - 44** |
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 31 |
| 6.2 | ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය | 31 |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | 32-35 |
| **පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව** | | **36-45** |

## 1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම

රජය සතු ව්‍යාපාරයන්හි [1] යහපාලන පැවැත්ම තහවුරු කිරීම තුළින් එම ආයතනවල කාර්යසාධනය ඉහළ නැංවීමේ අරමුණින් රජය සතු ව්‍යාපාරයන්හි කාර්යසාධනය අධීක්ෂණය සිදු කරන මූලික රාජ්‍ය ආයතනය ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2002 වර්ෂයේදී නැවත ප්‍රතිස්ථාපනය කරන ලද අතර 1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසේ විධිවිධාන අනුව රාජ්‍ය සංස්ථාවල මූල්‍ය පාලනය ස්ථාපනය කිරීමේ කටයුතු ද දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතට ගැනේ.

රජය සතු ව්‍යාපාර බලශක්තිය, ජලය, බැංකු හා රක්ෂණ, වරාය, පොදු ප්‍රවාහන, ගුවන් සේවා, ඉදිකිරීම් සහ ක්‍රමෝපායික අංශයන්හි සීඝ්‍ර ව්‍යාප්තියක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සුවිශේෂී අංගයක්ව පවතී. රජය සතු ව්‍යවසායන් 469 ක් අතරින් ව්‍යාපාර 52 ක් ජාතික ආර්ථිකය ඉහළ වර්ධන තලයකට පරිවර්තනය කිරීමෙහිලා උත්ප්‍රේරණ කාර්යයක් සිදු කරන අතර, මේවා ක්‍රමෝපායිකව වැදගත්වන රජය සතු වාණිජ ව්‍යවසායන් [2] ලෙස හඳුනාගෙන ඇත. වර්තමානයේ රජය සතු ව්‍යවසායන් වලින් 342 ක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඉතිරි රාජ්‍ය ව්‍යවසායන් 127 ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කෙරේ.

### 1.2. දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම

**මෙහෙවර**

රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත්කිරීම සඳහා, විශිෂ්ට පරිචයන් භාවිතා කරමින් යහපත් අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ශක්තිමත් කිරීම

**අරමුණු**

- රාජ්‍ය ව්‍යවසායයන් තුළ යහපාලනය වැඩි දියුණු කිරීම
- මහජන යහපත සුරක්ෂිත කිරීම
- හොඳම භාවිතයන් තුළින් කාර්යසාධනය ප්‍රශස්ත කිරීම

---

1.ඕනෑම ලිඛිත නීතියකින් ස්ථාපිත කොට ඇත්තා වූ රජයට අයිතිය හිමිවන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ වෙනත් ඕනෑම ආයතනයක් සහ රජයට බහුතර අයිතිය හිමි වන්නා වූ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති වාණිජ හෝ වාණිජ නොවන ක්‍රියාකාරකම් සිදු කරන්නා වූ සමාගම් රජය සතු ව්‍යාපාර වේ.

2.සේවා සහ භාණ්ඩ විකිණීම මගින් ආදායම් උපයනු ලබන ව්‍යාපාර කටයුතු වල නියැලී සිටින රජය සතු ව්‍යාපාර රජය සතු වාණිජ ව්‍යාපාර වේ.

## 1.3. ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ප්‍රතිපත්ති සැකසීම.
- වාණිජ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.
- රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ක්‍රියාත්මක කිරීමට අදාළව නව චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශවල සඳහන් යෝජනා අධ්‍යයනය කිරීම හා විශ්ලේෂණය කිරීම.
- රජය සතු ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය.
- පුද්ගලීකරණය කරන ලද රජය සතු ව්‍යාපාරවලට අදාළව අවබෝධතා ගිවිසුම්වල ඇතුළත් කරුණු පසු විපරම් කිරීම හා එම ආයතන හා සම්බන්ධ ගැටළු විසඳීමට සහාය වීම.
- පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කමිටුව සඳහා සහභාගී වීම සහ සහාය දැක්වීම.

## 1.4. සංවිධාන සටහන




අ.අ.ජ. - තිරේක අධ්‍යක්ෂ ජනරාල්
නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අ. · හකාර අධ්‍යක්ෂ

ස.නි. - සංවර්ධන නිලධාරී
ක.සේ.නි.. - කළමනාකරණ සේවා නිලධාරී
කාර්යාල සේවක සේවය - 08
රියදුරු - 08

## 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- කෘෂිකාර්මික අංශය
- සේවා අංශය
- ප්‍රතිපත්ති අංශය
- කර්මාන්ත අංශය
- පාලන හා ගිණුම් අංශය

## 1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් - අදාළ නොවේ.

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - අදාළ නොවේ.

**2. පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

**රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2025 වසරෙහි ලබාගත් ප්‍රගතිය, එයින් රටට හා ජනතාවට ලැබෙන ප්‍රතිලාභ සහ 2026 වසරේදී ලඟාකර ගැනීමට අපේක්ෂිත ප්‍රගතිය**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් වන 2025 කාර්ය සාධන වාර්තාව සඳහා පෙරවදනක් සැපයීමට ලැබීම මා ලද ගෞරවයක් සේ සළකමි. 2023 හා 2024 වර්ෂයන් මෙන්ම 2025 වර්ෂයද රාජ්‍ය ව්‍යවසායන් කෙරෙහිත්,පොදුවේ ජාතික ආර්ථිකය කෙරෙහිත් අභියෝග රැසක් පැවැති වර්ෂයකි. 2025 වර්ෂයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සළකා බලන විට පහත කරුණු වැදගත් වේ.

රාජ්‍ය ව්‍යාපාරයන්හි මෙහෙයුම් හා මුල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය කිරීමට අවශ්‍ය තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීම සඳහා හඳුන්වාදුන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ කළමනාකරණ තොරතුරු පද්ධතියට (PEDMIS) රාජ්‍ය ව්‍යාපාර 150 ක තොරතුරු ඇතුලත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ සියලු අංශවල නිලධාරීන් දැනුවත් කිරීම සහ අදාළ රාජ්‍ය ව්‍යාපාරයන්හි නිලධාරීන්ට අවශ්‍ය සහාය ලබාදීම අධීක්ෂණ අංශයේ මූලිකත්වයෙන් 2025 වර්ෂය තුළ සිදුකරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ රජය ඇතිකරගත් විස්තීර්ණ ණය පහසුකම් ගිවිසුමෙහි කොන්දේසි ප්‍රකාරව ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 හි 2025 වසරේ විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සමීපව අධීක්ෂණය මෙම අංශය විසින් සිදු කළ අතර, ඒ අනුව එම විගණිත මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවෙහි පල කිරීම සහ ප්‍රගතිය වාර්තා කිරීම සිදු කරන ලදී.

ආයතනික යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි නිර්ණායක වලට අනුකූලව රාජ්‍ය ව්‍යවසායයන් විසින් උපායමාර්ගික සැලසුම් සකස්කර ඇති ආකාරය සමාලෝචනය කරන ලදී.

වාර්ෂික වාර්තා පිළියෙල කිරීම, විගණනය කල වාර්ෂික ගිණුම් වාර්තා ලබාගැනීමේ ප්‍රමාදයන් සහ අඩුපාඩු මගහරවා ගැනීම, ආයතනික යහපාලනය හා කාර්යසාධනය වැඩිදියුණු කිරීම, උපායමාර්ගික සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායයන් දැනුවත් කිරීම සිදුකරන ලදී.

එසේම, මුදල් අමාත්‍යාංශය යටතට ගැනෙන රාජ්‍ය ව්‍යවසායයන් සහ භාණ්ඩාගාර ලේකම්වරයාට හිමිකාරිත්වයක් ඇති රාජ්‍ය සමාගම් සඳහා සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීමට අදාළ පත්වීම් ලිපි නිකුත් කිරීම අධීක්ෂණ අංශය මඟින් සිදුකරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ රජය විසින් ඇති කරගත් විස්තීර්ණ ණය පහසුකම් ගිවිසුම ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධ කොන්දේසි ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගති සමාලෝචනය සඳහා මෙම දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ සහභාගී වූ අතර එහිදී අදාළ නිරීක්ෂණ ලබාදීම සිදුකරන ලදී. එමෙන්ම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත, රාජ්‍ය ණය කළමනාකරණ පනත ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නියෝජනය කරමින්, පනත් වල ප්‍රතිපාදන සම්බන්ධ උපදෙස් ලබාදීම සිදුකරන ලදී.

එසේම මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද 2024 වසරේ වාර්ෂික වාර්තාව, 2025 වසරේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබිඹු කරන වාර්තාවන්හි රාජ්‍ය ව්‍යාපාර වල කාර්ය සාධනය පිළිබඳ පරිච්ජේදය පිළියෙල කිරීම සිදුවිය.

2025 වර්ෂයේදී රජය සතු සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වලින් රුපියල් මිලියන 47,332 ක අයබදු ආදායමක් රැස්කර ගැනිමට හැකියාව ලැබී ඇත. එය එම වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවට අනුව සියයට 127 ක ප්‍රමාණයක් වේ. එසේම 2025 වර්ෂයේ රජය සතු සමාගම්වලින් රු.මිලියන 9,210 ක ලාභාංශ ආදායමක් රැස්කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර, එය එම වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 73 ක් වේ.

ඉහත කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම්තුමා, නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරුන් විසින් ලබාදුන් සහයෝගය මහත් සේ අගය කරන අතර, මහා භාණ්ඩාගාරයේ නිලධරයන්ටත් විශේෂයෙන්ම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාගේ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතවේදීතාව පළකර සිටිමි.

බී.ඒ.ටී. රූද්‍රිගු
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

## 3 පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 | | සටහන | 2025 | 2024 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | 56,543,178,143 | 41,080,424,465 | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 56,543,178,143 | 41,080,424,465 | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | 56,543,178,143 | 41,080,424,465 | |
| - | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 109,653,926,608 | 178,101,727,294 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 239,601 | 3,947,645 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 5,801,741 | 5,322,761 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 136,029,845,035 | 90,270,024,212 | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **245,689,812,985** | 268,381,021,911 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | **302,232,991,129** | 309,461,446,376 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 281,665,274 | 1,000,000,000 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 301,951,325,855 | 308,461,446,376 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | | - | ඒසීඒ-2(ii) |
| 97,190,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 95,437,273 | 75,441,533 | ඒසීඒ-2(ii) |
| 1,285,406,413 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 1,278,500,842 | 795,550,310 | ඒසීඒ-2(ii) |
| 5,636,319 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 4,405,459 | 121,919,854,825 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - - | - | ඒසීඒ-2(ii) |
| 577,892,754 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 577,892,754 | - | ඒසීඒ-2(ii) |
| 1,966,125,486 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | **1,956,236,328** | 122,790,846,667 | |
| | මූලධන වියදම් | | | | |
| 2,860,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 2,553,980 | 730,318 | ඒසීඒ-2(ii) |
| 2,200,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 753,463 | 1,529,096 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| 112,263,604,853 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | 108,643,658,712 | 69,424,289,106 | ඒසීඒ-2(ii) |
| 1,500,000 | හැකියා වර්ධනය | 14 | 1,305,500 | 909,580 | ඒසීඒ-2(ii) |
| 2,835,147 | වෙනත් මූලධන වියදම් | 15 | 2,835,147 | 1,995,778,276 | ඒසීඒ-2(ii) |
| 112,273,000,000 | මුළු මූලධන වියදම් (උ) | | **108,651,106,802** | 71,423,236,377 | |
| | තැන්පතු ගෙවීම් | | 1,036,857 | 3,077,646 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 9,044,625 | 7,123,380 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | 136,029,845,035 | 90,270,024,212 | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 136,039,926,516 | 90,280,225,237 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 246,647,269,646 | 284,494,308,281 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | 55,304,056,209 | 23,967,138,094 | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | 55,304,056,209 | 23,966,573,709 | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | 564,385 | ඒසීඒ-3 |
| | | | 55,304,056,209 | 23,967,138,094 | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තතය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 39,202,926 | 39,751,844 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 14,839,589 | 11,596,705 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 564,385 |
| මුළු වත්කම් | | **54,042,515** | **51,912,934** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 14,766,846 | 10,726,706 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 39,202,926 | 39,751,844 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 72,744 | 869,999 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 564,385 |
| මුළු වගකීම් | | **54,042,515** | **51,912,934** |

පිටු අංක **07** සිට **29** දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක **30** සිට **36** දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 19-May-26 | දිනය : 2026/05/19 | දිනය : 2026/05/15 |
| ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම<br>මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්<br>මුදල් අමාත්‍යාංශය<br>කොළඹ - 01 | බී.ඒ.වී. රැදිගු<br>අධ්‍යක්ෂ ජනරාල්<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව<br>මහා භාණ්ඩාගාරය<br>කොළඹ 01 | රන්දිකා පෙරේරා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව<br>මහා භාණ්ඩාගාරය<br>කොළඹ 01 |

2

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සතය | සංශෝධිත |
|---|---|---|
| | 2025<br>රු. | 2024<br>රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 147,581,963 | 3,737,035 |
| අග්‍රිම ලැබීම් | 109,653,926,608 | 178,101,727,294 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 6,811,710 | 5,485,468 |
| තැන්පතු ලැබීම් | 239,601 | 3,947,645 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **109,808,559,882** | **178,114,897,441** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,951,592,919 | 870,745,718 |
| සහනාධාර සහ මාරුකිරීම් | 4,405,459 | 121,919,854,825 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | 3,859,480 | 1,639,898 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 839,507 | 548,388 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 281,665,274 | 1,000,000,000 |
| අත්තිකාරම් ගෙවීම් | 9,044,625 | 7,123,380 |
| තැන්පතු ගෙවීම් | 1,036,857 | 3,077,646 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **2,252,444,120** | **123,802,989,854** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **107,556,115,762** | **54,311,907,587** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොලී | - | - |
| ලාභාංශ / ලාභ | 1,088,296,413 | - |
| නිම්කම් ඉවත්වීමෙ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **1,088,296,413** | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වත්කම් ඉදිකිරීම, මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම | 108,644,412,175 | 54,311,343,202 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **108,644,412,175** | **54,311,343,202** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(107,556,115,762)** | **(54,311,343,202)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | **564,385** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | 564,385 |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | 564,385 |

**3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්**

**වාර්තා කිරීමේ පදනම**

**1) පිළියෙල කිරීමේ අරමුණ**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

**2) වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**3) මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**4) ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**7) මුදල් හා මුදල් සමාන දෑ**

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

**3.5** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව (රු.) | සංශෝධිත ඇස්තමේන්තුව (රු.) | ප්‍රමාණය (රු.) | මුල් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2002.03.00 | ලාභ | 49,610,000,000 | 37,405,000,000 | 47,332,367,849 | 127% |
| 2002.04.00 | ලාභාංශ | 6,218,000,000 | 12,595,000,000 | 9,210,810,294 | 73% |

**3.6** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම (රු.) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය (රු.) | සංශෝධිත ප්‍රතිපාදනය (රු.) | | |
| පුනරාවර්තන | 10,296,000,000 | 1,966,125,486 | 1,956,236,328 | 99.50% |
| ප්‍රාග්ධන | 101,395,000,000 | 112,273,000,000 | 108,651,106,802 | 96.71% |

**3.7** මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම (රු.) | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන (රු.) | සංශෝධිත ප්‍රතිපාදන (රු.) | | |
| - | - | - | - | - | - | - |

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,047,564.35 | 1,047,564.35 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 23,355,361.60 | 23,355,361.60 | - | 100% |
| 9153 | ඉඩම් | අදාළ නොවේ | - | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | - | | |

**3.9** විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඩී/ඒ/පීඊඩී/එෆ්ඒ/2025/17
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2026 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරි
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** මතය

ශීර්ෂය 241 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ

සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ආදායම් කළමනාකරණය

#### 3.1.1 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා

2015 ජුනි 22 දිනැති 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකතනය සහ ඇස්තමේන්තු සකස් කිරීම විධිමත් පරිදි සිදු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) **ආදායම් සංකේතාංකය 20.02.03.00 - ලාභ**

(i) සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් සංකේතාංක 20.02.03.00 - ලාභ වෙනුවෙන් සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 37,405 ක් වූ අතර, තත්‍ය ආදායම රු.මිලියන 47,332 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 127 ක් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 04 ක් මඟින් රු.මිලියන 205 ක ආදායමක් අයකර ගැනීමට ඇස්තමේන්තු කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එම ආයතන මඟින් කිසිදු ආදායමක් රැස් කරගෙන නොතිබූ අතර රාජ්‍ය ව්‍යවසායන් 04 ක ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීම සියයට 16 ත් 76 ත් අතර පරාසයක පැවතුණි.

(iii) උක්ත ආදායම් සංකේතයට දායක විය යුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන ආයතන එනම්, සංස්ථා 41 ක් සහ ව්‍යවස්ථාපිත ආයතන70 ක් පැවතියද 2025 වර්ෂයේ ලාභ යටතට දායක වන ආදායම් ඇස්තමේන්තුව සැකසීමේදී ආයතන 51 ක් එනම් මුළු ප්‍රමාණයෙන් සියයට 45 ක් පමණක් ඇතුලත් කර තිබුණි. ඒ අනුව, රාජ්‍ය ව්‍යවසායන්ගෙන් සියයට 55 ක් ලාභ ආදායමට කිසිදු දායකත්වයක් ලබා ගත නොහැකි ආයතන ලෙස 2025 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 11 කට අදාලව ලාභ ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණත්, එම ව්‍යවසායන්ගෙන් රු.මිලියන 15,305 ක ලාභ ආදායමක් ලැබී තිබූ අතර රාජ්‍ය ව්‍යවසායන් 23 කින් ඇස්තමේන්තු කරන ලද ලාභ ආදායමට වඩා වැඩියෙන් සියයට 7 ක සිට 500 දක්වා පරාසයකින් ලාභ ආදායමට දායක වී තිබුණි.

(ආ) **ආදායම් සංකේතාංකය 20.02.04.00 - ලාභාංශ ආදායම**

(i) සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේතාංක 20.02.04.00 - ලාභාංශ ආදායම සඳහා සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 12,595 ක් වූ අතර තත්‍ය ආදායම රු.මිලියන 9,211 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත

ආදායමට වඩා රු.මිලියන 3,384 ක් අඩුවෙන් රැස් කරගෙන තිබුණි. ඒ අනුව, එය ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 27 ක අඩුවීමකි.

(ii) රාජ්‍ය සමාගම් 05 කින් රු.මිලියන 1,472 ක ලාභාංශ ආදායමක් ඇස්තමේන්තුකර තිබුණද එම ආයතන වලින් සමාලෝචිත වර්ෂය තුළදී ලාභාංශ ආදායමට කිසිදු දායකත්වයක් ලබා දී නොතිබුණු අතර රාජ්‍ය සමාගම් 03 ක ආදායම් ඇස්තමේන්තු වලට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීම සියයට 20 ත් 54 ත් අතර පරාසයක පැවතුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ලාභාංශ ආදායමට ඇතුලත් නොකරන ලද රාජ්‍ය සමාගම් 6 කට අදාළව, රු.මිලියන 410 ක ලාභාංශ ආදායමක් ලැබී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය සමාගම් 07 කින් ඇස්තමේන්තු කරන ලද ලාභාංශ ආදායමට වඩා වැඩියෙන් සියයට 16 ක සිට සියයට 1,018 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභාංශ ආදායමට දායක වී තිබුණි

### 3.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයන් 08 ක් සහ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන වර්ෂය තුළ උපයෝජනය කල පසු රු.5,245,049 ඉතිරියක් පැවති අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 සිට සියයට 100 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ආ) 2025 මාර්තු 22 දිනැති අංක 01/2025 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3.1 වගන්තිය යටතේ රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධයෙන් වන විධිවිධාන විස්තීරණව දක්වමින් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි වියදම් පාලන උපදෙස් සහ දැනට වලංගුව පවතින අනෙකුත් චක්‍රලේඛවල සෙසු වියදම් පාලන උපදෙස් කෙරෙහි දැඩි අවධානය යොමු කරමින් කටයුතු කළ යුතු බව දක්වා තිබුණි. කෙසේ වුවද, වැය විෂය සංකේතාංක 1508 (වෙනත්) සඳහා 2025 දෙසැම්බර් 18 හා 23 දිනැති පරිපූරක ඇස්තමේන්තුව මඟින් රු.4,236,319 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් රු.1,190,683 ක් එනම් සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 28 ක ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි.

(ඇ) නිසි පරිදි අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව මුදල් රෙගුලාසි 66 මඟින් වැය විෂයයන් 02 ක් සඳහා පිළිවෙලින් රු.300,000 ක් හා රු.1,200,000 ක් ලෙස එකතුව රු.1,500,000 ක් ප්‍රතිපාදන වැඩිකරගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කළ ප්‍රතිපාදන මුදලින් සියයට 100 ක්ම උපයෝජනය කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 ප්‍රාග්ධන දායකත්වය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යවසායන් 09 කට අදාළව විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම හා 2025 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රජයේ ප්‍රාග්ධන දායකත්වය අතර, රු.මිලියන 7,382 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) රාජ්‍ය ව්‍යවසායන් 04 කට අදාළව එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන, රජයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීමේදී 2025 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව රජයේ ප්‍රාග්ධන දායකත්වය එකතුව රු.මිලියන 1,174,610 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 1,197,490 ක් වීම හේතුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රාග්ධන දායකත්වයෙහි රු.මිලියන 22,880 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) රාජ්‍ය සමාගම් 02 ක හිමිකාරීත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නාමික කළ අගය අනුව ගණනය කිරීමේදී 2025 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන දායකත්වයේ එකතු වටිනාකම රු.මිලියන 132 ක් වුවද, එය රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 1,272 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, 2025 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන වල ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 1,140 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) රාජ්‍ය සමාගම් 06 ක හිමිකාරීත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නාමික අගය අනුව ගණනය කිරීමේදී 2025 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.මිලියන 15,976 ක් වුවද, එය රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 15,522 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව 2025 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන වල ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 454 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2025 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය සමාගම් 16 කට අදාළව රු.මිලියන 40,048 ක රජයේ ප්‍රාග්ධන දායකත්වයක් සිදු කර තිබුණද, ඒ වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට හිමි කොටස් සංඛ්‍යාව රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

(ඊ) රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ රජයට අයත් ව්‍යවසායන්වල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 186,015 ක් වූ අතර ඉන් රු.මිලියන 35,669 ක් එනම් සියයට 19 ක් එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ වියදම් එනම් ණය හා ණය පොළී ගෙවීම්, වැටුප් හා වේතන ගෙවීම් හා ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල් වලින් සමන්විත වී තිබුණි.

(උ) ක්‍රියාකාරීත්වයේ නොමැති රාජ්‍ය ව්‍යවසායන් 27 ක් වසා දැමීම සම්බන්ධයෙන් අංක 25/1570/804/185 හා 2025 ඔක්තෝබර් 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඈවරකරුවන් පත් කර තිබූ පසුබිමක එසේ අක්‍රීය තත්ත්වයේ පැවති රාජ්‍ය ව්‍යවසායන්

02 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 10,148 ක ප්‍රාග්ධන දායකත්වයක් මහා භාණ්ඩාගාරය වෙතින් ලබා දී තිබුණි.

(උ) Litro Gas Lanka (Pvt) Ltd. ආයතනය සතුව පැවති Canwill Holdings (Pvt) Limited ආයතනයේ කොටස් 500,000,000 ක් 2025 ජූලි 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 25/1273/804/097-1 මගින් භාණ්ඩාගාර ලේකම් වෙත පවරා තිබූ අතර මෙම කොටස් හුවමාරුවට අදාළව 2025 දෙසැම්බර් 31 දින Canwill Holdings ආයතනය විසින් කොටස් සහතික පත්‍රයද නිකුත් කර භාණ්ඩාගාර ලේකම් වෙත කොටස් හිමිකාරීත්වය ලැබී තිබුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ මෙම කොටස් ආයෝජන වටිනාකම වූ රු.මිලියන 5,000 ගිණුම්ගත කර නොතිබුණි.

## 4.2 කාර්යභාරයන් අපේක්ෂිත මට්ටමින් ඉටු නොකිරීම

(අ) "මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම" යන ප්‍රධාන කාර්යය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ආයතන වල වාර්ෂික වාර්තා නියමිත දිනවල පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් විය. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන ආයතන 305 ක් පැවතිය ද, දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ඉදිරිපත් කර තිබුණේ දෙපාර්තමේන්තුව ක්‍රමෝපායිකව වැදගත් ලෙස සලකන ලද ආයතන 52 කට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අදාළ තොරතුරු පමණි. 2021 වර්ෂයේදී හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය සහ 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47 ඡේදය ප්‍රකාරව, මූල්‍ය වර්ෂයට අදාළ වාර්ෂික වාර්තා වර්ෂය අවසන් වී මාස 06 ක් ඇතුළත විගණන වාර්තාව සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2026 මැයි 20 දින වන විට 2024 වර්ෂය වෙනුවෙන් එකී රාජ්‍ය ව්‍යවසායන් 52 න් පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියේ ඇතුළත් කර තිබුණේ ආයතන 16 කට අදාළ වාර්ෂික වාර්තා පමණි.

(ආ) 2021 වර්ෂයේදී හඳුන්වා දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 පරිච්ඡේදය පරිදි වාර්ෂික වාර්තා ඉදිරිපත් කරන විට වාර්ෂික කාර්යය සාධන ඇගයීම් රැස්වීම් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ද ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ද ඉතා පහළ මට්ටමක පැවතුන බව නිරීක්ෂණය විය.

(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබූ රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 5.3 ඡේදය ප්‍රකාරව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද නුබුන්වත් බව සහතික කරන රාජ්‍ය සමාගම්වල බදු පසු ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට ගෙන්වා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය සමාගම් 04 කට අදාළව 2024 වර්ෂයේ ලාභාංශ වලින් එකතුව රු.මිලියන 4,233 ක් වූ ලාභාංශ ආදායමක් එකතු කරගෙන නොතිබුණි.

## 4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, ඇප තැන්පත් කළ යුතු රාජකාරී වන චෙක්පත් අත්සන් කිරීම හා ගබඩාව භාරව සිටින නිලධාරීන් දෙදෙනෙක් රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැන්පත් කර නොතිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුමත කාර්ය මණ්ඩලය හා සත්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය 86 ක් වූ අතර සත්‍ය කාර්යමණ්ඩලය 79 ක් වූයෙන් පුරප්පාඩු 10 ක් හා අතිරික්ත තනතුරු 03 ක් පැවතුණි. ඒ අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 05 ක් පැවතුනු අතර එය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් පුරප්පාඩු 01 ක්ද, නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ පුරප්පාඩු 01 ක් ද, නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ තනතුරු 03 කින් ද සමන්විත වී තිබුණි. ද්විතික මට්ටමේ පුරප්පාඩු 03, සංවර්ධන නිලධාරි තනතුරු වලින් සමන්විත වූ අතර තෘතික මට්ටමේ කාර්යාල කාර්ය සහයක තනතුරු 02 ක් ද පුරප්පාඩු වී තිබුණි.

(ආ) තවද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ අධ්‍යක්ෂ තනතුරු 02 ක් හා ද්විතික මට්ටමේ කළමනාකරණ සේවා නිලධාරි තනතුරු 01 ක අතිරික්තයක් ද පැවතුණි.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

**4.පරිච්ඡේදය – කාර්යසාධන දර්ශක**

**4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (2025 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | | |
|---|---|---|---|---|---|
| | 150% - 101% | 100% - 90% | 89% - 75% | 74% - 50% | 49% - 0% |
| **1. රාජ්‍ය ව්‍යාපාර වල යහපාලනය දියුණු කිරීම.** | | | | | |
| **1.1.රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහ මූල්‍ය විනය ස්ථාපිත කිරීම සඳහා මඟ පෙන්වීම සහ නියෝග නිකුත් කිරීම.** | | 100% | | | |
| **සාමූහික ගිවිසුම් වලට අදාළ මාර්ගෝපදේශ නිකුත් කිරීම.** | | | | | |
| චක්‍රලේඛ සංඛ්‍යාව. | | | | | |
| මාර්ගෝපදේශ සංඛ්‍යාව. | | | | | |
| අත්පොත් සංඛ්‍යාව | | | | | |
| **1.2. පරිපාලන අත්පොත් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම** | | 100% | | | |
| පරිපාලන අත්පොත් සංඛ්‍යාව | | | | | |
| **1.3 ප්‍රතිපත්තිමය කාරණා හැසිරවීම** | | 100% | | | |
| හසුරුවන ලද ප්‍රතිපත්තිමය කාරණා සංඛ්‍යාව | | | | | |
| **1.4. පෞද්ගලීකරණයෙන් පසු ගැටළු හැසිරවීම** | | 100% | | | |
| හසුරුවන ලද ගැටළු සංඛ්‍යාව | | | | | |
| **1.5. 2011 අංක 15 දරන මුදල් (සංශෝධන) පනතට අදාළ කටයුතු හැසිරවීම** | | | | | |
| හසුරුවන ලද ගැටළු සංඛ්‍යාව | | | | | |
| **1.6** පාලනය මත පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | | | |
| පවත්වන ලද පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව | | | | | |
| **1.7** සම්පත් දායකයින්යින් සැපයීම හරහා පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම | | 100% | | | |
| **2. රාජ්‍ය ව්‍යාපාර වල කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.** | | | | | |
